---

**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 11 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ විභාග වෙමින් පැවති නඩු දෙකකට අදාල ගෙවිය යුතු නඩු ගාස්තු රු.75,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.237,320 ක්වූ පුස්තකාල පොත් වටිනාකම හා සභාව විසින් ඉදිකරන ලද ගොඩනැගිලි 03 ක එකතු පිරිවැය රු.6,150,563 ක් ස්ථාවර වත්කම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අදාල ස්ථාවර වත්කම් වල වටිනාකම රු.1,192,255 ක් අඩුවෙන් හා රු.5,630,272 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර කර්මාන්ත ණය හිමියෝ රු.5,731,525 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු ගිණුම

මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටි වරිපනම් බදු ලෙස රු.229,899 ක් දක්වා තිබුණු අතර උපයෝගී ලේඛන අනුව එම ශේෂය රු.215,875 ක් වුයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.14,024 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.48,013,359 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.882,218 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.80,070 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක163 ප්‍රකාර වර්ෂයේ ආදායම ගණනය කිරීම සඳහා සාරාංශ ආදායම් ලේඛණය (ප්‍රා.ස.19) සකස් කර නොතිබුණි.

(ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 180 ප්‍රකාරව මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හෝ ආදායම් සම්බන්ධව රාජකාරි ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි.

(ඇ). ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී, අදාල භාණ්ඩ ගිවිසුම් ප්‍රකාරව නියමිත ගුණත්වයෙන් ගබඩාවට ලැබුණු බවට ගබඩා භාර නිලධාරී විසින් ලබාදිය යුතු සහතිකය

අවස්ථා 54 කදී එකතුව රු.882,102 ක්වූ භාණ්ඩ මිලදී ගැනීම් සඳහා ලබාදී නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් බදු | 1,150 | 389 | 991 |
| (ii). | බදු කුලී | 3,446 | 1,813 | 3,635 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 2,130 | 462 | 2,738 |
| (iv). | වෙනත් ආදායම් | 10,348 | 6,566 | 3,782 |

**2.3.2** බදු කුලී

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(i) වගන්තිය ප්‍රකාරව සභාව සතු කඩ කාමර 21 කින් අයවිය යුතු රු.905,430 ක්වූ හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු ව්‍යාපාරික ස්ථාන 04 ක් සමාලෝචිත වර්ෂයේ බදුදීමට කටයුතු නොකිරීම නිසා රු.409,433 ක ආදායම් අහිමි වී තිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ1994 අගෝස්තු 04 දිනැති අංක NCP/PL/4/7/19 දරන චක්‍රලේඛ ප්‍රකාරව සභාව සතු කඩ කාමර වසර 05 කට වරක්වත් තක්සේරු කර බදුකුලි සංශෝධනය කර නොතිබුණි.

**2.3.3 වෙනත් ආදායම්**

ආදායම් විෂයයන් 04 කට අයත් රු.3,781,701 ක්වූ හිඟ ආදායම් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(i) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3.4 ව්‍යාපාර බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව වෙළඳ ව්‍යාපාර වලින් අයකරනු ලබන ගාස්තු සංශෝධනය කර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 82,469 |
| (ii). | මුද්දර ගාස්තු | 640,700 |

**2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයෙන් 2008 වර්ෂයේදි ලැබුණ රු. 1,064,000 වටිනාකම වූ සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන කට්ටලය සහ අත්ට්‍රැක්ටර් 02 ක් හා කැබ්රථ 02 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පිළිගැනීම් සඳහා දරන ලද එකතුව රු.78,380 ක්වූ වියදම් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.6 අවිධිමත් ගනුදෙනු**

**------------------------**

සභාව සතු කැබ් රථය 2011 වර්ෂයේදී රු.327,950 ක් වැයකර අලුත්වැඩියා කර වර්ෂයක් ගතවීමටත් පෙර අබලන්ව තිබූ අතර වගකීම් සහතිකයක් ලබා නොගැනීම නිසා දෝෂ නිවැරදි කර ගත නොහැකිව ධාවනයෙන් ඉවත් කර කුලී පදනම මත ලබාගත් වාහනයකට සමාලෝචිත වර්ෂය තුල රු.312,400 ක් ගෙවා තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්ක්ෂමතා**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ). සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය, සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය සේවකයින් 10 දෙනකුගෙන් අයවිය යුතු වසර 10 කට වඩා පැරණි සේවක ණය එකතුව රු.79,526 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(i) වගන්තියේ විධිවිධාන අනුගමනය නොකර තනතුරු 13 ක් සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගෙන රු.1,522,576 ක් වැටුප් වශයෙන් සහා අරමුදලින් ගෙවා තිබුණි.

(ඈ). වසර 03 කට වඩා පැරණි ගෙවිය යුතු ශේෂවල එකතුව රු.804,469 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ). දිර්ඝ කාලයක සිට අයවීමට ඇති රු.116,033 ක්වූ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.8 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

------------------------------------------------------------

(අ). ව්‍යාපෘතියකට අදාලව ගිවිසුම් ප්‍රකාරව සභාව විසින් ගෙවීම් නොකිරීම මත බාහිර ආයතනයක් විසින් සභාවට එරෙහිව අධිකරණයේ ගොනුකර තිබුණු නඩුවක තීන්දුව මත සභාව රු.325,121 ක් සහ ඊට අදාල නෛතික පොලිය ගෙවිය යුතුව තිබුණි.

(ආ). බාහිර පුද්ගලයෙකුගෙන් ලබාගත් තැන්පතු මුදල් සභාව විසින් ගිවිසුම් ප්‍රකාරව ආපසු නොගෙවීම නිසා එකී පුද්ගලයා සභාවට එරෙහිව රු.401,700 ක වන්දි ඉල්ලා අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි.

**2.9 සනඅපද්‍රව්‍ය කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාව විසින් පරිසර හිතකාමී කසල කළමනාකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**03. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ). කොන්ත්‍රාත් පරිපාලනය